# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,149 — 1960 ජූනි 24 වැනි සිකුරාදා — 24.6.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, හැම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 439 | තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 451 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 441 | ආණ්ඩුවේ තොගවල දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 441 | රථ ගිම වීකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බංගිරාදිය විකිණීම ... ... | 451 | විවිධ දැන්වීම් ... ... ... | 453 |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා මෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැනෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු යෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

**(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.**

**සංලක්ෂ්‍යය.—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.**

**5. අවශ්‍ය සුදුසුකම්.—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.**

**6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද ඔවුනු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.**

**7. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.**

**(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.**

**(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.**

**(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.**

**(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

---

## රජයේ දේශ සංචාරක කාර්යාංශය

### ගොඩනැගිලි පරීක්ෂක තනතුර (තාවකාලික)

රජයේ දේශ සංචාරක කාර්යාංශයේ තාවකාලික ගොඩනැගිලි පරීක්ෂක තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙසින් ආරාධනා කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 ජූලි මස 8 වැනි දින දවල් 12ට හෝ ඊට මත්තෙන් කොළඹ 1, රජයේ දේශ සංචාරක කාර්යාංශයේ අධ්‍යක්ෂ තුමාට ලැබෙන සේ එවිය යුතුයි.

2. වැටුප.—රුපියල් 3,900—180—රුපියල් 5,340 වාර්ෂික වැටුපක් ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම් : සෑම අයදුම්කරුවෙක් ම—

(අ) 1960.7.1 දිනදී වයස අවුරුදු 25ට නොඅඩු බවටත්, අවුරුදු 45ට නොවැඩි බවටත්,

(ආ) යහපත් කල්ක්‍රියාවෙන් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත්,

(ඉ) (1) ලංකා කාර්මික විද්‍යාලයේ සතර අවුරුද්දක සිවිල් ඉංජිනේරු විද්‍යාවේ පාඩම් මාලාවක් ගොඩනැගිලි පිළිබඳව තුන් අවුරුද්දක පළපුරුද්දක් සමග සාර්ථක අන්දමින් අවසන් කර ඇති බවටත්, හෝ

(2) මිනින්දෝරු සහ මට්ටම් කිරීම සම්බන්ධයෙන් මිනින්දෝරු ජනරාල්වරයාගෙන් බලපත්‍රයක් ලබා ගොඩනැගිලි වැඩ සම්බන්ධයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් ඇති බවටත්, හෝ

(3) සිවිල් සහ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේ ආධුනික සේවයේ අවුරුදු 5ක් සම්පූර්ණ කර තිබීමත් අතිරේක වශයෙන් ගොඩනැගිලි හෝ විශාල ගොඩනැගිලි වැඩ සහ මිනින්දෝරු වැඩ සම්බන්ධයෙන් තුන් අවුරුද්දක පළපුරුද්දක් තිබෙන බවටත්, හෝ

(4) යටත් පිරිසෙයින් ඉංග්‍රීසි කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී තිබිය යුතු බවත් සහ යටත් පිරිසෙයින් පාරවල් සහ ගොඩනැගිලි වැඩ සම්බන්ධයෙන් දස අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්දක් සහ මිනින්දෝරු සහ මට්ටම් කිරීම සම්බන්ධයෙන් හොඳ දැනීමක් හිමිව තිබෙන බවටත්,

සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අවශ්‍ය සුදුසුකම් නැති අයදුම්කරුවන් ඉල්ලුම් කිරීම අනවශ්‍යයි.)

4. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. මසක් කල් දීමක් ඇතුව සේවය අවසන් කළ හැකිය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ කොටස්කරුවෙකු විය හැක.

5. මේ සම්බන්ධ සියළුම ඉල්ලුම් පත්‍ර සහ ලියුම් ගනුදෙනු, අධ්‍යක්ෂ තුමාට ලැබෙන සේ එවිය යුතුයි. මේ හැර රජයේ දේශ සංචාරක කාර්යාංශයේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලික වශයෙන් නොඑවිය යුතුයි.

6. අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍රවල පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය. (ස. ල. බවුතීස්ම සහතික පත්‍ර උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ.)

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන හෝ වෘත්තීය සහතික පත්‍රය,

(ඇ) තම සුදුසුකම්, චරිතය මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක්. (රාජ්‍ය සේවයෙහි සිටින අයදුම්කරුවන්ට මේ උප වගන්තිය යටතේ සහතික පත්‍ර එවීමට නියම කරනු නොලැබේ.)

7. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පළ වූද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම්වලට අදාළ වූද, පොදු කොන්දේසි බලන ලෙස මතක් කරමි.

8. එවන සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගැනීම නවත්වා 10 දිනක් ඇතුළත එබඳු දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණහොත් ඒ බව රජයේ දේශ සංචාරක කාර්යාංශයේ අධ්‍යක්ෂ තැනට වහාම දැන්විය යුතුයි. මෙසේ නොකළ හොත් ඔහු ගැන සලකා බැලීමට ඇති යුතුකම නැති වේ.

ඩී. අළුවිහාරේ,
රජයේ දේශ සංචාරක කාර්යාංශයේ අධ්‍යක්ෂ.

1960 ජූනි 17 දිනදී,
කොළඹ 1.

### ආකෘති පත්‍රයයි

### රජයේ දේශ සංචාරක කාර්යාංශය

### තාවකාලික ගොඩනැගිලි පරීක්ෂක තනතුරක්

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි) :————.

(අ) පෙලපත් නාමය :————.

(ආ) වෙනත් නම් :————.

(2) තැපැල් ලිපිනය :————.

(3) (අ) 1960 ජූලි 1 වැනි දිනට නියම වයස :————.

(ආ) උපන් දිනය :————.

(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි. එය ආපසු එවනු නොලැබේ.)

(4) ජාතිය සහ කෙසේ ලැබුනේද යන බව :————.

(5) ඉල්ලුම්කරුගේ පියාගේ සම්පූර්ණ නම :————.

(6) උපන් ස්ථානය—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) ඔහුගේ පියාගේ :————.

(ඉ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ :————.

(ඊ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තනුවන්ගේ : ————.

(7) විවාහක, අවිවාහක හෝ වැන්දඹු බව :————. (විවාහක නම් විවාහවූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න.)

(8) අධ්‍යාපන සුදුසුකම් සහ අන්තිමට සාමර්ථ්‍යය ලත් විභාගය (දින සහිතව)—

(අ) ඉංග්‍රීසි :————.

(ආ) සිංහල, දෙමළ :————.

(9) කාර්මික සුදුසුකම් සහ සාමර්ථ්‍යය ලත් විභාග (දින සහිතව) : ————.

(10) ඉහත සඳහන් 3 වන ඡේදයේ (ඉ) කොටසේ කුමන වගන්තියට අයත් සුදුසුකම්වලින් ඔබ මෙම තනතුරට ඉල්ලුම් කිරීමට සුදුස්සකු විදැයි සඳහන් කරන්න :————.

(11) කාර්මික පළපුරුදු :————.

(12) පාසලෙන් අස්වූදා සිට කළ රක්ෂාවල් :————.

(13) වෙනත් විශෙෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ තොරතුරු : ————.

(14) ඔබ ණයගැතිකමින් නිදහස් ද ? නොඑසේ නම් කෙතරම් ණය ගැතිද ? :————.

(15) වෙනත් විස්තර :————.

මේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති කරුණු සත්‍යවූ සහ නිවැරදි බවට සහතික කරමි. තවද මෙහි සඳහන් කරුණු අසත්‍ය හෝ වැරදි සහගතයයි කලින් දැන ගතහොත් එය මේ තනතුර සඳහා නුසුදුසුකමක් හැටියටත් පත් වූවාට පසුව දැන ගතහොත් කිසිම වන්දි ආදියක් නැතිව ෂේවයෙන් නෙරපා හැරීමේ දඬුවමටත් යටත් වන බව මම හොඳින් දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දාතම :————.

සටහන් ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය :————.

ඉල්ලුම්පත : රජයේ දේශ සංචාරක කාර්යාංශයේ අධ්‍යක්‍ෂ, කොළඹ 1.

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/102/16 (ජී).

**වාර්ෂික වැටුප් රු. 3,900—180වේ 8 හා රු. 240සේ 5—රු. 6,540ට (රු. 5,580 පෙර කාර්‍යක්‍ෂමතා කඩඉම සහිත) වැටුප් ක්‍රමයට උපාධිධාරී භාෂා පරිවර්තකයන් උසස් කිරීමේ විභාගය—1960වේ ජනවාරි**

පහත නම් සඳහන් උපාධිධාරී භාෂා පරිවර්තකයන් වර්ෂ 1960ක්වූ ජනවාරි මස 9 වැනි දින පවත්වනු ලැබූ ඉහත සඳහන් විභාගයෙන් සාමාර්ථ්‍යය ලබා ඇති බැව් මෙයින් දැනුම් දෙමි :—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| කාරියප්පෙරුම, ඩී. එස්. | ... | තැපැල්. |
| ගුණතිලක, එම්. එච්. | ... | මුදල් අමාත්‍යාංශය. |
| මදුරප්පෙරුම, ජේ. ඒ. | ... | ආහාර, වාණිජ හා වෙළඳ අමාත්‍යාංශය. |
| සුබසිංහ, කේ. (මෙනෙවිය) | ... | ඔඩිටර් ජනරාල්. |

හ. ඒ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960ක්වූ ජූනි මස 20 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

342/33/1 (සීබී/සී).

### සරප් සේවයේ III වැනි ශ්‍රෙණියට බඳවා ගැනීමේ (සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි) විභාගය

වර්ෂ 1959 යේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වනු ලැබූ (සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි) සරප් සේවා විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයන් සරප් සේවයේ III වැනි ශ්‍රෙණියට පත් කිරීමට තෝරා ගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරණු ලැබේ :—

| නම | | ලිපිනය |
|---|---|---|
| අමරසිංහ, ඩී. ඇන්. ... | ... | ආඩිගලවත්ත, ඌරුගමුව |
| කරුණාගරන්, වී. ... | ... | 14, පොන්නෙයි පාර, කොඹඩාඩි, යාපනය |
| කරුණාසේන, එච්. ... | ... | 288, එපිටමුල්ලවත්ත, මීගොඩ |
| කිරිමුදියන්සේ, ජේ. ඇම්. | ... | ගොඩවිට, පොතුහැර |
| කුමාරසිංහ, කේ. වී. ඩී. ජේ. | ... | '' විජයවාස '', යාත්‍රාමුල්ල, බෙන්තොට |
| කුලතුංග, ඇල්. | ... | මීගහකුඹුර, බුලත්සිංහල |
| කුලරත්න, වයි. ඒ. ඩී. | ... | '' රත්නගිරි '', පහළයාගොඩ, ගණේමුල්ල |
| කොතලාවල, ඩී. ඩී. | ... | අන්නසිවත්ත, බෝමිරිය, කඩුවෙල |
| ගුණසිරි, ජී. ... | ... | ගලගෙදර, පාදුක්ක |
| දයාරත්න, ඩබ්ලිව්. | ... | අතලේ පාසැල බාරේ, දෙහිපිටිය, බුරුලබැද්ද |
| ධර්මතිලක, ටී. ඇම්. | ... | හේනෙගෙදර, අම්කිරිගල, රුවන්වැල්ල |
| පියරත්න, ඇස්. ... | ... | '' නන් න '', මුදලිගම, බොන්දුපිටිය, ධර්ගාටවුන් |
| පියරත්න, ඩී. ඩබ්ලිව්. | ... | පොකුන්වල, පනාවෙල, ඇහැලියගොඩ |
| පියසිරි, ඩී. | ... | දන්දෙනිය, මිදිගම, අහන්ගම |
| පියසේන, ඇම්. ඩී. ... | ... | ඉන්ද්‍රාවත්ත පාර, දෙයගම, ගල්පාත |
| පීරිස්, ඇන්. පී. ... | ... | 44, කෙලින් වීදිය, ජා-ඇල |
| පෙරේරා, ඇන්. වී. ... | ... | 237ඒ, දළුගම, කැළණිය |
| පෙරේරා, පී. ඒ. සී. ඒ. | ... | කුමර නිවස, දළුගම, කැළණිය |
| පෙරේරා, ඇම්. ඇන්. ටී. | ... | අංක 262, කොරළවැල්ල, මොරටුව |
| ප්‍රනාන්දු, යූ. පී. ඒ. ... | ... | මනක්කුලම, කාක්කපල්ලිය |
| ප්‍රේමරත්න, එච්, ඇල්. ඩබ්ලිව්. | ... | රත්නසිරි, නාවලපිටිය |
| මැකී, ඇම්. ඇස්. ඇම්. | ... | '' මන්සිළුරාහම් '', දෙමළහීරිය, අරනායක |
| රත්නායක, ඩබ්ලිව්. ඒ. | ... | දෙවලපොල, වේයන්ගොඩ |
| ලයනල්, ඩී. | ... | මදුරාවල, අහුරුවාතොට |
| ලියනපතිරන, ජී. ඇස්. ඒ. | ... | 502, ගාළුපාර, කොල්ලුපිටිය |
| විමලදස, ඇන්. ඩී. | ... | පලන්නොරුව, ගෝනපොල |
| සමරකෝන්, ආර්. බී. | ... | '' සමරගිරි '', ඉළුක්ගොඩ, කළුගමුව, කුරුණෑගල හරහා |
| සමරසිංහ, ඇස්. ඩබ්ලිව්. | ... | දොරනගොඩ, උඩුගම්පොල |
| සිරිසේන, ඇන්. කේ. | ... | රිල්ලොලුව, ගිරිඋල්ල |
| සුරේන්ද්‍රනාදන්, ඇස්. පී. | ... | 195, කෙළින් වීදිය, යටියන්තොට |
| සේනාරත්න, ඩී. ... | ... | ජේ. ඩී. ඇස්. සේනාරත්න මහතා බාරේ, උඩුපිල, මිරිස්ස |
| සේරම්, ඩී. කේ. ... | ... | 96, හොරන පාර, පාදුක්ක |
| හැරි, ඇම්. ... | ... | අළුත්ගෙදරවත්ත, යකාබැද්ද පාර, අකුරැස්ස |

මේ අපේක්ෂකයන්ට වහා ම තනතුරු සැපයීමට ආණ්ඩුව භාර නොගනියි. නමුත් ඇබෑර්තු ඇතිවන විට, ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සියළු ම පත්වීම් තුන් අවුරුදු කාලයක ආධුනික තත්ත්වයේ වන අතර, වෛද්‍ය පරීක්ෂණයකට සහ සරප් සේවයේ කොන්දෙසි වලට යටත් වෙනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960වෙ ජුනි මස 14 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

## ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), විදුලි පන්දම් බැටරි සැපයීම සඳහා 1960 අගෝස්තු 9 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 අගෝස්තු 8 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි

1960 ජූනි 24 වැනි දින,
කොළඹදීය.

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය තැ.පෙ. 500, කොළඹ 1), සකස් කළ ගල්තාර සැපයීම සඳහා 1960 ජූලි 12 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ජූලි 11 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූනි 24 වැනි දින,
කොළඹදීය.

---

කොළඹ සෙනේට් ගොඩනැගිල්ලේ ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් රාජකීය ලංකා ගුවන් හමුදවට 1960/61 මුදල් වර්ෂයේ සැපයීම් සහ වෙනත් වැඩ උදෙසා ටෙන්ඩර් පත්‍ර 1960 ජූලි මස 14 වෙනි දින පෙරවරු 9.30වන තෙක් භාරගනු ලැබේ.

ඉහත කී ටෙන්ඩර් පත්‍රයක් ලබාගැනීම පිණිස රාජකීය ලංකා ගුවන් හමුදවේ සිවිල් අංශයේ ගණකාධිකාරී තුමා වෙත රුපියල් සියයක (රු. 100/-) මුදල් වෙන් වෙන් වශයෙන් සෑම සලාකයකටම තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි.

මෙකී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ දින ඉහත කී කාර්‍යාලයේදී එම වේලාවට ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරණ ලද අයට පෙනී සිටිය හැක.

### සලාක්

| මස් සලාක ‘‘ ඒ ’’ | කොළඹ | කටුනායක | දියතලාව | චීන වරාය |
|---|---|---|---|---|
| මාළු සහ කරවල සලාක ‘‘ බී ’’ | එම | එම | එම | එම |
| කිරි ආහාර සහ ගොවිද්‍රව්‍ය සලාක ‘‘ සී ’’ | එම | එම | එම | එම |
| පාන් සලාක ‘‘ ඩී ’’ | එම | එම | එම | එම |
| එළවළු සලාක ‘‘ ඉ ’’ | එම | එම | එම | එම |
| ස්වදේශීය උදැසන ආහාර සලාක ‘‘ එෆ් ’’ | එම | එම | එම | එම |
| හාල් කුළුබඩු සහ ටින් කෑම වර්ග සලාක ‘‘ ජී ’’ | එම | එම | එම | එම |
| ගිලන් පහසුකම් ආහාර | | එම | | |
| වියළි පලාපු දර සැපයීම | එම | | | |
| බැරැක්කයේ සහ වෙනත් නිල ඇඳුම් සේදීම | එම | එම | එම | එම |
| නිල ඇඳුම් මැසීම හා අලුත් වැඩියා කිරීම | එම | ගබඩාව නො. 1 | එම | එම |
| ටයර් නැවත පිරවීම | එම | ගබඩාව නො.1 | එම | එම |
| බුමු තුරුණු මෙත්ත කවර ආදිය (ඩ්‍රයි ක්ලීන්) | එම | | එම | එම |
| පිරිසිදු කිරීම | එම | කටුනායක | එම | එම |
| මෙට්ට කොට්ට කුෂන් ආදිය නැවත සකස් කිරීම | එම | එම | එම | එම |

ජේ. ඇල්. බාකර්,
ගුවන් හමුද අණදෙන නිලධාරි තැන.

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු සහ වෙනත් බඩු එහාමෙහා ගෙනයාම

1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට වර්ෂයක කාලසීමාවක් තුළ පහත සඳහන් ස්ථානයන් අතර අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම සඳහා ටෙන්ඩර් 1960 ජූලි මස 27 වැනි බදාදා පෙරවරු 10.30 දක්වා මහනුවර, මධ්‍යම කොටස භාර සහකාර සුරාබදු කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ.

(අ) ත්‍රිකුණාමලයේ දුම්රිය බඩු ගබඩාව හා ත්‍රිකුණාමලයේ ඕර්ස් හිල් හි පිහිටි සුරාබදු ගුදමත් අතර,

(ආ) මඩකලපුවේ දුම්රිය බඩු ගබඩාව හා මඩකලපුවේ පිහිටි සුරාබදු ගුදමත් අතර.

2. මේ සම්බන්ධයෙන් රුපියල් දහයක (රු. 10) මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට රිසිට්පතක් ඉදිරිපත් කිරීමෙන්, මහනුවර, මධ්‍යම කොටස භාර සහකාර සුරාබදු කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ කාරණය පිළිබඳ වැඩිදුර විස්තර සියල්ලක්ම එම සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකිය.

ටී. බී. වඩුගොඩපිටිය,
සුරාබදු කොමසාරිස් තැන.

1960 ජූනි මස 15 වැනි දින,
කොළඹ, සුරාබදු කොමසාරිස් තැනගේ කාර්යාලයේදීය.

---

## ග්‍රාම සංවර්ධන හා ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුව

නුවර වටපුලුවේ පේෂකර්ම ආයතන භූමියට පැති බැම්මක් බැඳීමට සහ පාසලට යන පාරේ බෝක්කුවක් බැඳීමට 60.7.15 දින පෙරවරු 10.30 දක්වා ම විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

රු. 25 ඇප මුදලක් තැන්පත් කර 60.6.27 දින සිට 60.7.13 දින දක්වා ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

ඇම්. ඇස්. පෙරේරා,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂ තැන.

1960 ජූනි 20 දින,
කොළඹ 7,
ටොරින්ටන් චතුරශ්‍රයේදීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊශාන දිසාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 12,500/-කට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන්

ටෙන්ඩර 1960 ජූලි මස 13 වැනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | තැන්පත් කළයුතු මුදල |
|---|---|
| 1. කවුඩුල්ල උප කොට්ඨාශයේ රොටවැවේ ද්විත්ව කම්කරු නිවාසයක් සෑදීම (අංක 1) | රු. 25/- |
| 2. කවුඩුල්ල උප කොට්ඨාශයේ රොටවැවේ ද්විත්ව කම්කරු නිවාසයක් සෑදීම (අංක 2) | රු. 25/- |
| 3. කවුඩුල්ල උප කොට්ඨාශයේ මින්නේරියේ ද්විත්ව කම්කරු නිවාසයක් සෑදීම | රු. 25/- |
| 4. කවුඩුල්ල උප කොට්ඨාශයේ ගල්ඔයේ ද්විත්ව කම්කරු නිවාසයක් සෑදීම | රු. 25/- |

තැන්පත් කළ යුතු මුදල කවුඩුල්ල වාරිමාර්ග කායඕලයෙහි හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් 1960. 6. 27 වැනි දින සිට 1960. 7. 11 වැනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර කවුඩුල්ල වාරිමාර්ග කායඕලයෙන් ලබාගත හැක.

දැනට ආණ්ඩුවේ වැඩ කරගන යන කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ වැඩවල තත්ත්වය පිළිබඳ සහතිකයක් එම වැඩ භාර නිලධාරී තැනගෙන් ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවසථාවේදී පෙනී සිටීමට කැමති කොන්ත්‍රාත්කරුවන් 1960 ජූලි මස 13 වැනි දින පෙරවරු 9.30ට ඊශාන දිසාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කායඕලයට පැමිණිය යුතුයි.

වැඩි විස්තර සඳහා කවුඩුල්ල උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් විමසන්න.

ඕ. ඒ. ගුණවර්ධන,
කවුඩුල්ල උප වාරිමාර්ග ඉංජිනේරුතැන,
කවුඩුල්ල උප කොට්ඨාශය.

1960 ජූනි 16 වැනි දින දීය,
වාරිමාර්ග කායඕලය,
හිඟුරක්ගොඩ.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට රෝද හතරම ඉන්ජිමෙන් ක්‍රියා කරන මෝටර් රථයක් සැපයීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ජූලි මස 15 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඉහත සඳහන් වාහනය සැපයීම සඳහා ආණ්ඩුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

පෝර්ම කොළ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රු. 100 ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි ටෙන්ඩර් දැන්වීම බලන්න.

ඒ. වී. රිචඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

යාන්ත්‍රික අංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ගන්නොරුව, පේරාදෙණිය,
1960 ජූනි මස 16 දා.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ටොන් 1½ මෝටර් ට්‍රක්ස් දෙකක් සැපයීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ජූලි මස 15 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඉහත සඳහන් වාහන සැපයීම සඳහා ආණ්ඩුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

පෝර්ම කොළ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රු. 100 ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි ටෙන්ඩර් දැන්වීම බලන්න.

ඒ. වී. රිචඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

යාන්ත්‍රික අංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ගන්නොරුව, පේරාදෙණිය,
1960 ජූනි මස 16 දා.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලොරි දෙකක් සැපයීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ජූලි මස 15 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඉහත සඳහන් වාහන සැපයීම සඳහා ආණ්ඩුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

පෝර්ම කොළ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රු. 100 ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි ටෙන්ඩර් දැන්වීම බලන්න.

ඒ. වී. රිචඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

යාන්ත්‍රික අංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ගන්නොරුව, පේරාදෙණිය,
1960 ජූනි මස 16 දා.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් කර්මාන්තයන් තැනීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960. 7. 22 වැනි සිකුරාදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

1. වැලිසර ලය රෝහලෙහි මතුපිට කානුව තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960. 7. 18 වැනි සඳුදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ, කානු තැනීමේ හෝ ඒ හා සමාන කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රුපියල් 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත් කොළඹ ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කායඕලයේ අංක 163 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුව කුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7,
දිනය, 20. 6. 1960.

3. බිම අඟල් 4ක ඝනකමට කොන්ක්‍රීට් යොදා පිළියෙල කර, සිමෙන්ති දැමිය යුතුය.

4. වහල සීලිමකින් සමන්විත විය යුතුය.

5. නගරයේ ජල නල ක්‍රමයෙන් ජලය සැපයිය යුතුවේ.

මේ සියල්ලක්ම සම්පූර්ණ කර තිබේ.

පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු සිය වියදමෙන් තමන්ගේම වගකීම උඩ පහත සඳහන් කරුණු පිළිපැදිය යුතුවේ:—

1. අඩි 6ක උසට බිත්ති, සුදු පිඟන් ගඩොලින් ආවරණය කළ යුතුය.

2. අපිරිසිදු ජලය කුණු කසල සඳහා ඇති කාණු වලට ගලා බසින පරිදි කටයුතු සැලැස්විය යුතුවේ.

3. මස් කැපීම සඳහා පාවිච්චි කරනු ලබන කොටය තද ලීයෙන් සෑදූ එකක් විය යුතුවේ.

4. කම්කරුවන් සඳහා ජල පහසුව ලබාදිය යුතුය.

5. කුණු කසල සහ අපතේ යන ද්‍රව්‍ය දැමීමට ආවරණ සහිත බාල්දියක් තැබිය යුතුය.

6. මේස මත සිදුරු කළ නොහැකි ද්‍රව්‍යයකින් තැනූ තට්ටුවක් යෙදිය යුතුය.

7. මස් වෙළඳාම සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් තිබිය යුතුය.

8. අනුගමනය කළ යුතු පිළිවෙළ මස් වෙළඳාමේ සංශෝධන පනතෙහි සම්පූර්ණයෙන් සඳහන් කර තිබේ.

යටත් පිරිසෙයින් 1960 ජූලි 2 දා වෙළඳ සැල විවෘත කළ යුතුය.

පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු සිය වියදමෙන් තමන්ගේම වගකීම උඩ වෙළඳ සැල වායු සමීකරණය කළ යුතුය. එසේ කළ යුත්තේ නිවාස කොමසාරිස්වරයාගේ හෝ කොළඹ නගර සභාවේ හෝ උපදෙස් අනුවයි.

වෙළඳ සැලේ බිත්ති සහ බිම පිඟන් ගඩොලින් හෝ එවැනිම, කොමසාරිස්වරයා හෝ පළාත් පාලන ආයතනය හෝ අනුමත කරන ලද ද්‍රව්‍යයකින් ආවරණය කළ යුතුය.

මැස්සන් බෝවීම වැළැක්වීමට කොමසාරිස් වරයා හෝ පළාත් පාලන ආයතනය හෝ උපදෙස් දෙන පරිදි අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය.

පිරිසිදුකම සහ සෞඛ්‍යයට අදාල තත්ත්වයක් ඇති කිරීමේ අදහසින් කොමසාරිස් වරයා හෝ පළාත් පාලන ආයතනය හෝ අනුමත කරන ලද ඇඳුමින් සෑම සේවකයෙකුම සැරසී සිටිය යුතුය.

කුණු කසල ආදිය ඉවත දැමීම සඳහා පළාත් පාලන ආයතනය නියෝග කරන අයුරු සෑම විධි විධානයක්ම යෙදිය යුතුවේ.

සාප්පු ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රුපියල් 350 ක් වේ.

සෑම ටෙන්ඩර් කරුවකුම මාස තුනක කුලිය තැන්පත් කළ යුතුවා පමණක් නොව එයට අමතරව කොමසාරිස් තැනට ගෙවිය හැකි වැඩිම මූලික මුදල කොපමණ දැයි සඳහන් කළ යුතුය. එම මූලික මුදල ආපසු දෙනු නොලැබේ.

කිසිම හේතුවක් නොපෙන්වා ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කොමසාරිස් වරයා කෙරෙහිම තබා ගනු ලැබේ. ඔහුගේ එකී තීරණය අවසාන තීරණය වේ.

1960 ජූනි 29 දා පෙරවරු 10 ට පෙර ජාතික නිවාස කොමසාරිස් වරයාට ලැබෙන සේ ටෙන්ඩර් පත්‍ර සිල් තබන ලද කවරවල බහා එවිය යුතුය.

ලංකා පුරවැසියන්ගෙන් පමණක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

කොළඹ 2.

---

## ආහාර දෙපාර්තමේන්තුව

1960 අගෝස්තු 1 වෙනිදා සිට 1961 සැප්තැම්බර් 30 වෙනිදා දක්වා කාලය තුල පහත සඳහන් සේවාවන් ඉටුකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ යුනියන් පෙදෙසේ (තැපැල් පෙට්ටිය අංක 569) ආහාර, වානිජ හා වෙළඳ අමාත්‍යාංශයේ (ආහාර, අලෙවි කිරීම හා සමුපකාර අංශය) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 ජූලි 15 වෙනි සිකුරාදා පස්වරු 2.30 තෙක් බාරගනු ලැබේ.

සේවාවන් —

1. බඩු ගබඩාවල අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ඉවත් කොට දුම්රිය වැගන් වලට පටවා අඩුක් කිරීම.

2. බඩු ගබඩාවල අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ඉවත් කොට "බෝ මෝටර්ස්" (Boom Conveyors) වල අඩුක් කිරීම, ඒවායින් ඉවත්කොට වැගන් වලට හා ලොරිවලට පටවා අඩුක් කිරීම (දනට මෙම සේවය පවතින්නේ විජය කුමාර වේදිකාවේ පමණයි).

3. බඩු ගබඩාවල අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ඉවත්කොට, ලොරි වලට පටවා අඩුක් කිරීම.

4. බඩු ගබඩාවල ආහාර ද්‍රව්‍ය ලොරිවලට පටවා අඩුක් කිරීම.

5. "බෝ මෝටර්" වල අඩුක්කොට ඇති ද්‍රව්‍ය ඉවත්කොට ලොරි වලට පටවා අඩුක් කිරීම (විජය කුමාර වේදිකාවේදී නැව් වලින් කෙලින්ම "බෝ මෝටර්" වලට බා ගබඩා නොකර කෙලින්ම ලොරිවලට හෝ වැගන් වලට පටවන බඩු සම්බන්ධයෙන් පමණක් දනට මෙම සේවය පවතී).

6. ලොරිවල අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ඉවත්කොට වැගන් වලට පටවා අඩුක් කිරීම (මෙය කළ යුත්තේ බත්තල් වල බඩු ලොරිවල පටවා කෙලින්ම වැගන් වලට යවන ස්ථාන වලය.)

7. බඩු ගබඩාවල අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ඉවත්කොට ලොරි වල පටවා අඩුක් කිරීම, ලොරිවල අඩුක්කොට ඇති බඩු ඉවත් කොට වැගන්වලට පටවා අඩුක් කිරීම.

8. "බෝ මෝටර්" වල දොඹකරයෙන් ආහාර ද්‍රව්‍ය ඉවත් කිරීම හා ඒවායේ අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ඉවත් කිරීම, එම ආහාර ද්‍රව්‍ය බඩු ගබඩාවල ඕනෑම උසකට අඩුක් කිරීම (දනට මෙම සේවය පවතින්නේ විජය කුමාර වේදිකාවේ බඩු ගබඩාවේ පමණයි).

9. ලොරිවල අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ඉවත්කොට බඩු ගබඩාවේ බිම තැන්පත් කිරීම, ඒවා එම ලොරි වලටම පටවා නැවත අඩුක් කිරීම (මෙසේ කළ යුත්තේ තෝර පවුලට අයත් පියලි සහිත ආහාර ද්‍රව්‍ය වලදී පමණයි).

10. බඩු ගබඩාවේ එක කොටසක අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ඉවත් කොට එම ගබඩාවේම වෙනත් කොටසක නැවත අඩුක් කිරීම.

11. ගබඩාවක අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ඉවත්කොට ලොරිවලට පටවා අඩුක් කිරීම, එසේ අඩුක්කොට ඇති ආහාර ද්‍රව්‍ය ලොරිවලින් ඉවත්කොට කොළඹ ප්‍රදේශයේ පිහිටි වෙනත් ගබඩාවක නැවත අඩුක් කිරීම.

12. ගබඩාවක ආහාර ද්‍රව්‍ය ගෙන ගොස් එම ගබඩාවේම නැවත අඩුක් කිරීම.

13. අඩුක්කොට ඇති ගෝනි හා මලු "බූම් කොන්වේයර්" (Boom Conveyors) වලට පැටවීම (මෙසේ පැටවිය හැක්කේ "බූම් කොන්වේයර්" තිබෙන විට පමණකි). "බූම් කොන්වේයර්" වලින් ඉවත්කොට ලොරිවල පටවා අඩුක් කිරීම (මෙසේ පැටවිය යුත්තේ ගබඩාවේදී එම බඩු බෙදා හැරීම සඳහාය).

14. අඩුක්කොට ඇති ගෝනි හා මලු "බූම් කොන්වේයර්" වලට පැටවීම (මෙසේ පැටවිය හැක්කේ "බූම් කොන්වේයර්" තිබෙන විට පමණකි). ඒවායින් ඉවත් කොට ලොරිවල පටවා අඩුක් කිරීම, ලොරි වලින් ඉවත්කොට වැගන් වලට පටවා අඩුක් කිරීම.

15. අඩුක්කොට ඇති ගෝනි හා මලු "බූම් කොන්වේයර්" වලට පැටවීම (මෙසේ පැටවිය හැක්කේ "බූම් කොන්වේයර්" තිබෙන විට පමණකි). ඒවායින් ඉවත්කොට "බෝ මෝටර්" වල අඩුක් කිරීම, ඒවායින් ඉවත්කොට වැගන් වල හෝ ලොරිවල පටවා අඩුක් කිරීම.

16. ගබඩාවක එක කොටසක ඇති ගෝනි හා මලු ඉවත්කොට "බූම් කොන්වේයර්" වලට පැටවීම, ඒවායින් ඉවත්කොට ඕනෑම උසකට අඩුක් කිරීම.

කොළඹ යුනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් කාර්යාලයෙන් 1960 ජූලි 15 වෙනිදා දහවල් 12 තෙක් ලබාගත හැකි ෆෝර්මවල (පිටපත් දෙකක) ටෙන්ඩර් පත්‍ර පිළියෙල කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීම සඳහා, ආහාර කොමසාරිස් වෙත රුපියල් 100 ක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් විස්තර ප්‍රකාශනයක් ආහාර කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1960 ජූනි 15 වෙනි දින,
කොළඹ, යුනියන් පෙදෙසේ
අංක 330 දරණ ස්ථානයේදීය.

## ආහාර දෙපාර්තමේන්තුව

ලොරි චැසි 10කට අළුත් බොඩි ගැසීම සඳහා ටැන්ඩර් පත්‍ර, කොළඹ යුනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර, වාණිජ සහ වෙළඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 ජූලි මස 15 වෙනි සිකුරාද පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

1960 ජූලි 15 වෙනිදා දහවල් 12 තෙක් කොළඹ යුනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් වෙත රුපියල් 250ක් තැන්පත් කොට ලබාගත හැකි ෆෝර්මවල (පිටපත් දෙකක් ලෙස) ටෙන්ඩර් පිළියෙල කළ යුතුයි. ටෙන්ඩර් පිළිබඳ විස්තර හා කොන්දේසි ද ආහාර කොමසාරිස් ගෙන් ලබාගත හැක.

පී. ආර්. ද සිල්වා,
ආහාර කොමසාරිස් වෙනුවට.

1960.6.16 වෙනි දින,
කොළඹදීය.

---

## මහනුවර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක

**1960/1961 වර්ෂයට මහනුවර දිස්ත්‍රික්කය තුල ආහාර ද්‍රව්‍ය ගෙනයාම**

1960 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා යෙදෙන මුදල් වර්ෂයට මෙහි පහත සඳහන් රජයේ සැපයීම් ගබඩාවලට ආහාර ද්‍රව්‍ය සහ "කෙයාර් කිරි පිටි" (පැටවීම සහ බෑම ඇතුලුව) සඳහා ටැන්ඩර් භාරගනු ලැබේ :—

| | |
|---|---|
| මහනුවර, | නාවලපිටිය, |
| කටුගස්තොට, | හැටන්, |
| වත්තේගම, | කඩුගන්නාව, |
| ගම්පොල, | කුන්ඩසාලේ. |

සෑම ටැන්ඩරයක්ම මහනුවර නියෝජ්‍ය ආහාර පාලක ගෙන් ඉල්ලුම්කොට ලබාගත් ඉල්ලුම් ෆෝර්මයක වියයුතු අතර මාවෙත එවන සෑම ටැන්ඩර් ෆෝර්මයක්ම පිටපතකුත් සමග එවිය යුතුයි.

ටැන්ඩර් ෆෝර්මයක් ලබාගැනිම සඳහා ඒ වෙනුවෙන් මහනුවර කච්චේරියේ රු. 250 ක මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ටැන්ඩර් ෆෝර්මයක් ලබාගැනීමේදී ඉදිරිපත් කල යුතුයි.

නියමිත ආකෘති පත්‍රයක පුරවා නොඑවන ලද කිසිම ටැන්ඩරයක් භාරගනු නොලැබේ. 1960 අගෝස්තු මස 6 වෙනි දින දවල් 12 වන තෙක් පමණක් ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ටැන්ඩර් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහල කෙලවරේ "ගබඩාවේ ආහාර ද්‍රව්‍ය ගෙනයාම සහ ඉසිලීම සඳහා ටැන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කර ලියා පදිංචිකල තැපැලෙන් එවිය යුතුයි.

1960 අගෝස්තු මස 8 වෙනි දින පස්වරු 2.30 ට ප්‍රථමයෙන් සියලුම ටැන්ඩර්, වාණිජ හා වෙළඳ කටයුතු අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 2 කියා එවිය යුතුයි.

මේ සඳහා සම්පූර්ණ විස්තර මහනුවර නියෝජ්‍ය ආහාර පාලක තැන ගේ කායඎලයෙන් කායඎලීය වැඩකරන වේලාවන්හිදී දැනගැනීමට පුලුවන.

පී. ඇම්. ඇම්. විජේසූරිය,
නියෝජ්‍ය ආහාර පාලක තැන වෙනුවට,
මහනුවර දිස්ත්‍රික්කය.

1960 ජූනි 2 දින,
කච්චේරිය,
මහනුවර.

---

## මාතලේ දිස්ත්‍රික්කයේ "ඇදිහැස" කිරිපිටි සහ ආහාර ද්‍රව්‍ය පැටවීම සහ ගෙනයෑම සඳහා 1960-61 අවුරුද්ද වෙනුවෙන් ටැන්ඩර් පත්‍ර කැඳවීම

කොළඹ ආහාර, වෙළඳ හා වානිජ කටයුතු භාර අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ඔක්තෝබර් මාසයේ පළමුවෙනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා මාතලේ දිස්ත්‍රික්කය තුල "ඇදිහැස" කිරි පිටි සහ ආහාර ද්‍රව්‍ය පැටවීම සහ ගෙනයෑම සඳහා 1960 ජූලි මස 26 වෙනි කුජ දින පස්වරු 2.30 දක්වා ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

මාතලේ කච්චේරියේ රු. 250ක් තැන්පත් කර ලබාගන්නා ලද කුවිතාන්සියක් මාතලේ කච්චේරියේ නියෝජ්‍ය ආහාර පාලක නිලධාරි තැනට ඉදිරිපත් කිරීමෙන් ලබාගත හැකි ටැන්ඩර් ෆෝර්මයක ඉල්ලුම් කළ යුතුයි.

1960 ජූලි මස 25 වෙනි දින දවල් 12 වන තුරු ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර මාතලේ නියෝජ්‍ය ආහාර පාලක නිලධාරි තැනගෙන් ලබාගත හැක.

බන්දුල ඇස්. ද සිල්වා,
නියෝජ්‍ය ආහාර පාලක වෙනුවට.

1960 ජූනි මස 17 වැනි දින,
මාතලේ කච්චේරියේදීය.

---

## ආහාර පාලක දෙපාර්තමේන්තුව—බදුල්ල

**1960/61 වර්ෂයට බදුල්ල දිස්ත්‍රික්කය තුළ ආහාර ද්‍රව්‍ය හා ඇදිහැස කිරි පිටි ගෙනයාම**

1960 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා යෙදෙන මුදල් වර්ෂයට, බදුලු දිස්ත්‍රික්කයේ ඇති බදුල්ල, බණ්ඩාරවෙල හා හපුතලේ ආහාර ගබඩාවලට ආහාර ද්‍රව්‍ය හා ඇදිහැස කිරි පිටි බෑම සහ ගෙනයාම සඳහා 1960 ජූලි මස 26 වැනි දින පෙරවරු 2.30 දක්වා ආහාර පාලක දෙපාර්තමේන්තුව සහ ගොවිජනසේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා වෙනුවෙන් ටෙන්ඩර්, ආහාර, වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් සභාවේ සභාපතිතුමා, 330, යූනියන් පෙදෙස, කොළඹ 2 විසින් භාරගනු ලැබේ.

2. හාලිඇල සහ ඇල්ල යන ආහාර ගබඩාවලට 1960 ජූලි මස 26 වැනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර්, බදුලු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලකතුමා, කච්චේරිය, බදුල්ල විසින් භාරගනු ලැබේ.

3. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර බදුලු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලකතුමාගෙන් ලබාගත හැක. බදුලු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලකතුමා විසින් භාරගනු ලබන ටැන්ඩර් ආකෘති පත්‍ර සඳහා රුපියල් පනහක මුදලක් ද ආහාර, වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් සභාවේ සභාපතිතුමා විසින් භාරගනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා රුපියල් දෙසිය පනහක මුදලක් ද බදුල්ලේ දිසාපති කායඎලයේ තැන්පත්කර ඉන් ලැබෙන රිසිට් පත මා වෙත ඉදිරිපත් කළ යුතුයි. ආකෘති පත්‍ර ලාංකිකයින්ට සහ ලාංකික ව්‍යාපාර හා සමාගම්වලට දෙනු ලැබේ.

4. ටෙන්ඩර් පත්‍රයට නියමිත ආකෘති පත්‍රවල හැර වෙනත් ෆෝරම්වල ඉදිරිපත් කරන ටෙන්ඩර් බාරගනු නොලැබේ. ටෙන්ඩර් පත්‍රවලට නියමිත ආකෘති පත්‍ර 1960 ජූලි මස 26 වැනි දින දවල් 12 දක්වා මෙම කායඎලයෙන් නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර හා කොන්දේසි සඳහා බදුලු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලකතුමාගේ කායඎලයෙන් විමසන්න.

ටී. අයි. කාසීම්,
බදුලු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර
පාලකතැන වෙනුවට.

1960 ජූනි මස 15 වැනි දින,
බදුලු කච්චේරියේදීය.

---

## 1960-61 මුදල් වර්ෂය තුළ රත්නපුර දිස්ත්‍රික්කයේ ආහාර ද්‍රව්‍ය සහ කිරිපිටි ගෙනයාම

වර්ෂ 1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට වර්ෂ 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා යෙදෙන මුදල් වර්ෂයට (1) රත්නපුර, (2) කහවත්ත සහ (3) ඕපනායක යන තැන්හි පිහිටි ආහාර ගබඩාවල්හි ආහාර ද්‍රව්‍ය සහ කිරිපිටි ගෙනයාම, පැටවීම, බෑම ආදී සේවයන් සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ, යූනියන් පෙදෙසේ අංක 330 දරණ සථානයේ පිහිටි ආහාර, වාණිජ සහ වෙළඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් භාරගැනීමේ මණ්ඩලයේ සභාපති තුමා විසින් වර්ෂ 1960 අගෝස්තු මස 5 වැනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර රත්නපුරේ නියෝජ්‍ය ආහාර පාලක තැනගෙන් ලබාගත හැක. ආකෘති පත්‍ර ලබා ගැනීමේදී රුපියල් 250ක මුදලක් රත්නපුරේ දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඉන් ලැබෙන රිසිට් පත මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් ඉල්ලුම් කළ යුතු ආකෘති පත්‍ර වර්ෂ 1960 අගෝස්තු මස 5 වැනි සිකුරාදා දහවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

4. මේ පිළිබඳ වැඩි විස්තර රත්නපුරේ නියෝජ්‍ය ආහාර පාලක තැනගෙන් දැනගත හැක.

එච්. ඞී. වීරරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක තැන
වෙනුවට.

1960 ජූනි 2 වැනි දින,
ආහාර පාලක කාර්යාලය,
කච්චේරිය, රත්නපුර.

## 1960-61 මුදල් වර්‍ෂය තුළ රත්නපුර දිස්ත්‍රික්කයේ ආහාර ද්‍රව්‍ය සහ කිරි පිටි ගෙනයාම

වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට වර්‍ෂ 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා යෙදෙන මුදල් වර්‍ෂයට—

(1) ඇහැළියගොඩ සහ

(2) දැල

යන තැන්හි පිහිටි ආහාර ගබඩාවල්හි ආහාර ද්‍රව්‍ය සහ කිරිපිටි ගෙන යාම, පැටවීම, බෑම ආදී සේවයන් සඳහා ටෙන්ඩර් පත්‍ර රත්නපුරේ නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් වර්‍ෂ 1960 අගෝස්තු මස 5 වැනි සිකුරාදා දහවල් 12 වනතෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර රත්නපුරේ නියෝජ්‍ය ආහාර පාලක තැනගෙන් ලබාගත හැක. ආකෘති පත්‍ර ලබාගැනීමේදී රුපියල් 50ක මුදලක් රත්නපුරේ දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඉන් ලැබෙන රිසිට් පත මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් ඉල්ලුම් කළ යුතු ආකෘති පත්‍ර වර්‍ෂ 1960 අගෝස්තු මස 4 වැනි බ්‍රහස්පතින්දා සවස 4 වනතෙක් නිකුත් කරනු ලැබේ.

4. මේ පිළිබඳ වැඩි විස්තර රත්නපුරේ නියෝජ්‍ය ආහාර පාලක තැනගෙන් දැනගත හැක.

එච්. බී. වීරරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක තැන වෙනුවට.

1960 ජූනි 2 වැනි දින,
ආහාර පාලක කාර්යාලය,
කච්චේරිය, රත්නපුර.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

පාලම් සඳහා වානේ රාමු සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය : තැ. පෙ. 547, කොළඹ 1) 1960 ජූලි මස 27 වැනි බදාදා දහවල් 12 වන තෙක් භාර ගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම් කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 ජූලි මස 23 වැනි සෙනසුරාද දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1960 ජූලි මස 28 වැනි බ්‍රහස්පතින්ද පෙරවරු 10ට ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

සැ. ඔ. පෙ. රූපසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1960 ජූනි මස 15 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹදී ය.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

නාන කාමරවලට සවිකරන උපකරණ සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය : තැ. පෙ. 547, කොළඹ 1) 1960 අගෝස්තු මස 3 වැනි බදාදා දහවල් 12 වන තෙක් භාරගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම් කොළ වල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ජූලි මස 30 වැනි සෙනසුරාද දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1960 අගෝස්තු මස 4 වැනි බ්‍රහස්පතින්ද පෙරවරු 10ට ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

සැ. ඔ. පෙ. රූපසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1960 ජූනි මස 18 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹදී ය.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ගෙනයාහැකි ගිනියම්කර පැස්සීමේ යන්ත්‍ර සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය : තැ. පෙ. 547, කොළඹ 1) 1960 අගෝස්තු මස 3 වැනි බදාදා දහවල් 12 වන තෙක් භාර ගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 ජූලි මස 30 වැනි සෙනසුරාද දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1960 අගෝස්තු මස 4 වැනි බ්‍රහස්පතින්ද පෙරවරු 10ට ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශ කාරයාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩරකරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

සැ. ඔ. පෙ. රූපසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1960 ජූනි මස 18 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹදී ය.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ඉබේ ක්‍රියාකරන ඇඳුම් සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය : තැ. පෙ. 547, කොළඹ 1) 1960 අගෝස්තු මස 17 වැනි බදාදා දහවල් 12 වන තෙක් භාර ගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම් කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 අගෝස්තු මස 13 වැනි සෙනසුරාද දහවල් 12 වන තෙක් ටෙන්ඩර පෝරම කොළ නිකුත් කරනු ලැබේ.

1960 අගෝස්තු මස 18 වැනි බ්‍රහස්පතින්ද පෙරවරු 10ට ජනසතු සේවා, නැව සහ ප්‍රවාහණ පිළබඳ අමාත්‍යාංශ කාරයාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩරකරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

සැ. ඔ. පෙ. රූපසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1960 ජූනි මස 17 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹදී ය.

---

## මැදවච්චියට ඇල්. ටී. විදුලි බලය සැපයීම, පිහිටුවීම සහ බෙදාහැරීම සඳහා කැඳවන ටෙන්ඩර් සම්බන්ධවයි

1. ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්‍ෂ 1960 ක්වූ ජූලි මස 27 වන බදාදා දවල් 12.00 දක්වා තැපැල් වැඩ සහ විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ: පෙ. 547, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කායර්‍යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත්

කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහතකී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම වලයි. වර්ෂ 1960 ක්වූ ජූලි මස 22 වෙනි දින වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1960 ක්වූ ජූලි මස 28 වන බ්‍රහස්පතින්දා අ. භා. 2.30ට තැපැල් වැඩ සහ විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ,
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1960 ක්වූ ජූනි මස 24 වෙනි දින දීය.

---

## පේරාදෙනියේ විශ්ව විද්‍යාලයේ භූගෝල සහ භූගර්භ ගොඩනැගිලිවලට විදුලි උපකරණ පිහිටුවීම

1. ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1960 ක්වූ අගෝස්තු මස 10 වන බදාදා දවල් 12.00 දක්වා තැපැල් වැඩ සහ විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහතකී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම වලයි. වර්ෂ 1960 ක්වූ අගෝස්තු මස 5 වෙනි දින වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1960 ක්වූ අගෝස්තු මස 11 වෙනි බ්‍රහස්පතින්දා අ. භා. 2.30 ට තැපැල් වැඩ සහ විදුලිබල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ,
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1960 ක්වූ ජූනි මස 24 වෙනි දින දීය.

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### පිරිමින්ගේ පාගන බයිසිකල් 360ක් සැපයීම

විශේෂ විස්තර වලට අනුකූලව, පිරිමින්ගේ පාගන බයිසිකල් 300ක් සැපයීම සඳහා ප්‍රධාන නිෂ්පාදකයන්ගෙන් හෝ බලය ලත් නියෝජිතයන්ගෙන් ටැන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 4 වෙනි දින පෙරවරු 9.30 දක්වා කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ තැපැල්පති තුමා විසින් භාරගනු ලැබේ.

2. කොළඹ, මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ, ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු තැනගෙන් ලබාගත් ෆෝර්මවල (අනුපිටපතක් ද සමග) ටැන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම විස්තර ඔහුගෙන් දැනගත හැක. ටැන්ඩර් පත්‍ර නිකුත් කිරීම සඳහා කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ටැලිග්‍රාප් කැෂියර් වෙත මුදලින් රුපියල් 100ක් තැන්පත් කොට ලබාගත් රිසිට් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

3. 1960 අගෝස්තු මස 3 වෙනි දින පස්වරු 4 වන තෙක් ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. කොන්ත්‍රාත්තුව යථා පරිදි සම්පූර්ණ කිරීම සඳහා පොරොන්දු පත්‍රයකට අත්සන් ගැනීමට සැලකිය යුතු ඇප කරුවන් ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබේ. අවශ්‍ය ඇප මුදල ටැන්ඩරයේ වටිනාකමින් සියයට 5කි. කොන්ත්‍රාත්තුවට බැඳෙන විට මුද්දර ව්‍යවස්ථාව යටතේ ගිවිසුම් පත්‍රයට මුද්දර ගැසීමට තෝරා ගත් ටැන්ඩර්කරු බැඳී ඇත.

5. 1960 අගෝස්තු මස 4 වෙනි දින පෙරවරු 10ට ප්‍රධාන තැපැල් කාර්යාලයේ පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවේදී ටැන්ඩර් කරුවනට එහි පැමිණ සිටිය හැක.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට් මාස්ටර් ජනරාල්.

1960 ජූනි 17 වෙනි දින,
ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ.

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### වානේ ගරාදි (ලැටිස්) කුඹ ගස් දෙකක් ගලවා ගෙන විත්, පින්තාරු කර ඉදි කිරීම

තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව සඳහා දැනට ත්‍රිකුණාමලයේ නිලාවැලිවල සවිකර ඇති අඩි 220ක් උස වානේ කුඹ ගස් දෙකක් ගලවා ගෙනවිත් පින්තාරු කර අඩි 200ක් උසට, වැලිකඩ ගුවන් විදුලි ස්ථානයෙහි සවිකිරීම සඳහා 1960 අගෝස්තු මස 4 වෙනි දින පෙරවරු 9.30 දක්වා කොළඹ, ප්‍රධාන තැපැල් කාර්යාලයේ තැපැල්පති විසින්, ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ, ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලයේදී, ටැන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලිය හැකිය. කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ටැලිග්‍රාප් කැෂියර් වෙත මුදලින් රු. 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු තැනගෙන් බලාපොරොත්තු ටැන්ඩර් කරුවනට ටැන්ඩර් පත්‍ර ලබා ගත හැකිය. තැන්පත් කරන ලද මුදල් ටැන්ඩරයෙහි සඳහන් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. පූර්වෝක්ත ප්‍රකාර ලබාගත හැකි ෆෝර්ම මගින් ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 අගෝස්තු මස 3 වෙනි දින පස්වරු 4 වන තෙක් ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. ඉහත සඳහන් ප්‍රකාර, ටැන්ඩර භාරගන්නා අවසාන දින සිට සති 6ක් දක්වා තමන්ගේ ටෙන්ඩරය වලංගු විය යුතු බව ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය. 1960 අගෝස්තු මස 4 වෙනි දින පෙරවරු 10ට ප්‍රධාන තැපැල් කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට එහි පැමිණ සිටිය හැක.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට් මාස්ටර් ජනරාල්.

1960 ජූනි 17 වැනි දින,
ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ලංකා ගමනාගමන මණ්ඩලයට බස්රථ, බස්වැසි සහ බස් බොඩි සැපයීම

(අ) ඩීසල්-ඇන්ජින් බස් වැසි හෝ (ආ) කොටස් එකට සවිකළ බොඩි සහිත චැසි හා (ඇ) සම්පූර්ණයෙන් හෝ පංගු වශයෙන් කොටස් ගැලවූ බොඩි සහිත චැසි සැපයීම සඳහා ටෙන්ඩර පත්‍ර එවන මෙන් කොළඹ 5, නාරාහේන්පිට ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් නිෂ්පාදකයන්ට හා නියෝජිතයන්ට පමණක් මෙයින් ආරාධනය කරනු ලැබේ. විවිධ මාදිලි හයක චැසි සහ ඒවායේ බොඩි වුවමනාය.

1960 ජූලි මස 23 වෙනිදා වන සෙනසුරාදා පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නවත්වනු ලැබේ.

කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේකම් මහතාගෙන් ඉල්ලූ විට විස්තරත් ටෙන්ඩර ෆෝරම කොළත් ලබාගත හැකිය. පිටපත් හතරකින් යුක්ත එක් එක් ටෙන්ඩරෆෝරම කට්ටලම වෙනුවෙන් රු. 5 ක් අයකරනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම්තැන

1960.6.16. කොළඹ 5.

## රත්නපුර කච්චේරිය

පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන රත්නපුර දිස්ත්‍රික්කයේ තැනීමට යෝජිත අළුත් ඔරුමඩු සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර වර්‍ෂ 1960 ජූලි මස 22 වෙනි දින පෙරවරු 9.30 වනතුරු ම විසින් ලියා පදිංචි කරනලද කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ද භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි කරනලද තැපෑලෙන් එවීමට අදහස් නොකරන කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර අතින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ අතින්ම හෝ මගේ කාර්යාලයේ සමාජසේවා පාලන සහකාර නිලධාරි තැනට භාරදිය හැක.

3. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර සීල් තබා පිට කවරයේ ටෙන්ඩර් ඉල්ලුම් කරන වැඩය සඳහන් කිරීමට හා තමන්ගේ නම හා ලිපිනය එහි සඳහන් කිරීමට අමතක නොකළ යුත්තේ ඒ විස්තර සඳහන් කිරීම අත්‍යවශ්‍ය හෙයිනි.

4. එක් එක් වැඩය සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර දෙක බැගින් එවිය යුතුවේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම ඒ ඒ වැඩය සඳහා රු. 10ක මුදලක් තැන්පත් කොට ඒ බවට කච්චේරියෙන් නිකුත් කරනලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රවල දෙවෙනි පිටපත් පරීක්‍ෂාකර බැලීමට අවශ්‍යයයි හැඟේනම් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සමග සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සලස්වා ගත හැක.

5. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ගැන සලකා බැලීමට එදිනම පෙරවරු 10ට කොන්ත්‍රාත්කරුවන් ඉදිරියෙහිදීම විවෘත කරනු ලබන හෙයින් කොන්ත්‍රාත්කරුවන් එදින නියමිත වේලාවට මෙම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුයි.

6. වැඩි විස්තර හා ආකෘති පත්‍ර 1960ක්වූ ජූලි මස 19 වෙනි දින දහවල් 12 දක්වා මගෙන් ලබාගත හැක.

7. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේදී පළමුව තමා ඉල්ලුම් කරන වැඩය ගැන තමාම සියළු විස්තර බලාගත් බැව් ඉල්ලීම් ගැන සැලකීමේදී හඟිනු ඇත.

### උපලේඛනය

| කටයුත්ත | පිහිටීම | කෝරළය |
|---|---|---|
| 1. ඔරු මඩුවක් ... | රත්නපුර වවුමේ පට්ටිඹිට්ට පවු මාවත | කුරුවිටි කෝරලය |
| 2. ඔරු මඩුවක් ... | දුම්බර වසමේ කැටේපොල යන ගම | කුකුළු කෝරලය |
| 3. ඔරු මඩුවක් ... | මුවගම වසමේ ඉඹුල්පිටිය යන ගම | නවදුන් කෝරලය |

ඇල්. බී. අබයරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති.

රත්නපුර කච්චේරිය,
20.6.60.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ මැතින් වෙළඳ පොලේ අතිරේක ආහාර ගබඩාව සෑදීම සඳහා 1960 මැයි මස 13 වෙනි දින අංක 12,130 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළමු ටැන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1960.6.20.

---

වීරකැටිය මධ්‍යම විද්‍යාලයට ජලය සහ විදුලි බලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ජූලි මස 13 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. තංගල්ලේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ජූලි මස 1 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 85,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය :

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන; නිදසුනක් : "වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝප රේෂන්";

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායාර්ලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාතර්මේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.6.20.

---

මොණරාගල ජලය සැපයීමේ යෝජනා ක්‍රමය සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්මලානේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ නිර්මාණ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ජූලි මස 15 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ "ඒ", "බී", "සී", යන කොටස්වල ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන; නිදසුනක් : "වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝප රේෂන්";

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායාර්ලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

6. ටෙන්ඩර් ෆෝරම ඉල්ලුම් කරන විට, මේ ආකාර වැඩ මීට පළමුවෙන් කර තිබෙන බවට හා නියම සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන්, ඔවුන්ගේ නිලධාරි මණ්ඩල සමන්විත බවට සාක්‍ෂි ලිය කිය විලි වලින් ඉදිරිපත් කල යුතුය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාතර්මේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේ දීය, 1960. 6. 11.

මොරටුවේ රජයේ රෝහලේ ගබඩා කාමරයක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ජූලි මස 13 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ දකුණු කොළඹ භාර ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ජූලි මස 1 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 24,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝර්ට් කෝප රේෂන්" ;
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.6.20.

---

අනුරාධපුර පොලිස් ස්ථානයට ජලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ජූලි මස 13 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුර ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ජූලි මස 1 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 37,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝර්ට් කෝප රේෂන්" ;
(ඇ) ග්‍රාම සංවර්ධක අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.6.20.

---

අම්බලන්ගොඩ ආරෝග්‍යශාලාවේ මිනී කාමරය හා මිනී කරත්ත මඩුව තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ජූලි මස 13 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ඇල්පිටිය ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කායභීලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ජූලි මස 1 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 18,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝර්ට් කෝප රේෂන්" ;
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.6.20.

---

අඹන්පොල රජයේ වැඩ දෙපාර්තමේන්තු ඕවර්සියර් නිවාසය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ජූලි මස 13, වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ව ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මාහෝ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 ජූලි මස 1 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 22,300ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : " වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝර්ට් කෝපරේෂන් "
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.6.20.

## බඩු බාහිරාදිය විකිණීම්

පාවිච්චියට ගතහැකි පරණ තුවක්කු තොගයක් 1960.7.6 වෙනි දින පෙරවරු 10ට මෙම කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම වෙන්දේසියේදී තුවක්කු ඉල්ලුම් කළ හැක්කේ තුවක්කුවක් ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇති අයට පමණකි. පිළිගනු ලැබූ ලන්සුවක් වෙනුවෙන් නියමිත මුදල වහාම ගෙවිය යුතුය.

ඩබ්ලිව්. පතිරණ,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1960ක්වූ ජූනි මස 17 වෙනි දින
කළුතර කච්චේරියේ දීය.

### කැලෑ දෙපාර්තමේන්තුව

කැළණි වැලි ගුඩ්ස් යාඩ්හි ලී ගබඩාවේ තිබෙන බුරුත කොටන් 66ක් 1960වෙ ජූලි මස 5 වැනි අඟහරුවාදා උදේ 9.30ට එම ස්ථානයේදී ප්‍රසිඩ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැ.ඩි. විස්තර කොළඹ මැක්ලම්පාරේ කැලණි වැලි ලී ගබඩාව භාර කරුගෙන් දැනගත හැක.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

තැ. පෙ. 509, කිච් පාර,
කොළඹ. 2.

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

ඒ. එක්ස්. 4002.

### රා රේන්ද විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය, 1960/61

1960 මැයි 6 දින නො. 12,127 දරණ රජයේ ගැසට් පත්‍රයේ පෙනෙන, රා රේන්ද විකිණීමේ කොන්දේසි හා 1960 අප්‍රේල් 14 දින නො. 12,107 දරණ අති විශේෂ රජයේ ගැසට් පත්‍රයේ සුරාබදු නිවේදන අංක 480හි පෙනෙන සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම්වල සහ කට්ටි තැබෑරුම්වල 1960 ඔක්තෝබර් මස 1 දින් සිට 1961 සැප්තැම්බර් මස 30 දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පහත දැක්වෙන කායඝාලයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝරම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ, පහත පෙනෙන " ජී " තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් සමගය :—

(ඒ) ඕනෑම කච්චේරියකින් ;
(බී) මැකලම් පාරේ සුරාබදු කායඝාලයෙන් ;
(සී) කොළඹ සුරාබදු මණ්ඩල කායඝාලයය ;
(ඩී) කළුතර සුරාබදු මණ්ඩල කායඝාලයය ;
(ඊ) හලාවත සුරාබදු මණ්ඩල කායඝාලයය.

3. මුද්‍රාව තැබූ කවරයක බහන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුයි; " රා තැබෑරුම/කට්ටි තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය..........................දිස්ත්‍රික්කය, 1960/61." කොළඹ නාගරික සභාවට අයිති තැබෑරුම් සහ තැබෑරුම් නො. 1—6, කට්ටි තැබෑරුම් නො.1,9—17. කොළඹ දිස්ත්‍රික්කයේ තැබෑරුම් සඳහාවූ ටෙන්ඩර් 1960 ජූලි 5 වැනි දින පහත දක්වා තිබෙන තැබෑරුමට කෙළින් ඇති ඒ ඒ වේලාවල් වලදී කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් භාරගන්නා අතර කොළඹ දිස්ත්‍රික්කයට අයත් පහත දක්වා තිබෙන ඉතිරි තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ජූලි 6 වැනි දින භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේදී කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් පත්කිරීමේ වරප්‍රසාදය ලබන අතර, ඉහත පෙනෙන රා රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, 9 වෙනි කොන්දේසියේ වරප්‍රසාදය යටතේ විකිණීමේ කොන්දේසිය අත්සන්කිරීම සඳහා මාස 2ක කුලියට සමාන මුදලක් තැන්පත් ඇප මුදල් වශයෙන් දිසාපති තැනට ගෙවිය යුතුයි.

5. මිළයට ගන්නා හැටියට වරප්‍රසාදය ලැබූ යම් ටෙන්ඩර් කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර, වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නටද පුළුවන. මෙයට විශෙෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල් ආපසු දීම සහ ඉහතකී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සු කරු විසින් තබන ලද ඇපයද ආපසු ගෙවනු ලැබේ.

6. එකක් හෝ සියලුම ටෙන්ඩර්, එසේ කිරීමට කිසි කරුණක් නොදක්වාම ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ දිසාපති තුමාට තිබේ.

7. තැබෑරුමක් භාරගත් අය විසින් තැබිය යුතු ඇපය, පොලී පිට ණය දෙන ලංකාණ්ඩුවේ (පොළියට ණය දෙන යුද්ධ ණය මුදල්ද ඇතුළුව) ඕනෑම පොරොන්දු පත්‍රයක මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකිය. මේ ණය මුදල් වලට බැංකුවල ස්ථිර තැන්පත් මුදල් වලටත් වඩා වැඩි පොළියක් ගෙවන අතර ආණ්ඩුව මගින් අර්ධ වර්ෂ වශයෙන් පොළී ගණන් බලා මුදල් හිමියාට ගෙවනු ලැබේ. රේන්ද කාලය අවසන්වූ පසු එය ආපසු ලබාගත හැකිවාක් මෙන්ම එය ඊට පසු රජයේ ටෙන්ඩර් කිරීමේ රේන්දයක් හෝ ගිවිසුමක් සඳහා ඇපය වශයෙන් එම සහතික ඉදිරිපත් කළ හැකි අතර, ඔහුගේ වෙන රේන්දයක් හෝ ගිවිසුමක් රජය සමඟ නොමැති නම් එම සහතිකවල වටිනාකම කිසිත් අපහසුවක් නොමැතිව ලෙහෙසියෙන්ම ආපසු ලබාගත හැක. බැංකුද මේ සහතික වැඩිමනත් ගැනීමේ ඇප වශයෙන් භාරණනු ලැබේ.

8. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබාගත හැක.

කච්චේරිය,
කොළඹ, 1960 ජූනි 17වැනි දින.

ජී. පී. තම්බයියා,
ආණ්ඩුවේ දිසාපති.

ඉහතකී තැබෑරුම්

### අනුමත කරනලද තැබෑරුම් ලැයිස්තුව—කොළඹ දිස්ත්‍රික්කය

කොළඹ නාගරික සභාව

විකුණන දිනය : 1960 ජූලි මස 5 වැනි දින

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව | (ඊ) තැබෑරුම් විවෘතකරන වේලාව | (එෆ්) තැබෑරුම් වසන වේලාව | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. |
|---|---|---|---|---|---|---|
| 1 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය | ප්‍රදේශය මෙසේ සීමාවී තිබේ:—උතුරට: පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා, ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා; නැගෙනහිරට: නාගලගම් වීදියේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා; දකුණට: මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා, නාගලගම් වීදිය සහ ලූකස් පාරේ සන්ධිය දක්වා; බටහිරට: ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වාත්ය | පෙ.ව. 10 ... | පෙ.ව. 7 ... | ප.ව. 7 ... | 5,000 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (ඊ) තැබෑරුම් විවෘත කරන වේලාව | (එෆ්) තැබෑරුම් වසන වේලාව | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. |
|---|---|---|---|---|---|---|
| 2 | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය | ප්‍රදේශය මෙසේ සීමාවී තිබේ: උතුරට : පර්ගියුෂන් පාර දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ ගඟ දක්වා, නැගෙනහිරට : ලූකස් පාරේ බටහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා; දකුණට: මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේසිට සන්ධිය දක්වා ලූකස් පාරේ සහ දනියෙල් පාරේ සන්ධිය දක්වා; බටහිරට: දනියෙල් පාරේ නැගෙනහිර පෙදෙසේසිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ හීනමුල්ල පටු මගේ සන්ධිය දක්වාත්ය | පෙ.ව. 10.15 | පෙ.ව. 7 | ප.ව. 7 | 5,000 |
| 3 | නො. 2 කොට්ඨාශය, මෝදර | (ඒ) ඉහළ වීදියේ ප්‍රදේශය, ඇන්ඩෲ පෙදෙසේ සන්ධිය දක්වා, අලුත්මාවත පාර සහ සාන්ත ඇන්ඩෲ පාරේ සන්ධිය දක්වා, (බී) සාන්ත ඇන්ඩෲ පාර පෙදෙසේ සන්ධිය දක්වා, ඉහළ-සාන්ත ඇන්ඩෲ පෙදෙසේ සහ මාෂල් වීදියේ සන්ධිය දක්වා, (සී) මෝදර වීදියේ ප්‍රදේශ සහ එහි සන්ධිය දක්වා, මාෂල් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා, (ඩී) සාන්ත ජේම්ස් වීදියේ දෙපස එහි සන්ධිය දක්වා, මෝදර වීදියේ සහ අලුත්මාවත පාරේ සන්ධිය දක්වා, (ඊ) අලුත්මාවත පාරේ දෙපස සහ එහි සන්ධිය දක්වා, එලි පටුමඟ සහ පහළ සාන්ත ඇන්ඩෲ පෙදෙස් සන්ධිය දක්වාත්ය | පෙ.ව. 10.30 | පෙ.ව. 7 | ප.ව. 7 | 5,000 |
| 4 | නො. 5 කොට්ඨාශය කොටහේන බටහිර | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට: ස්කිනර් පාරේ දකුණු පෙදෙසේ සන්ධියේ සිට, කෝටබෝන් වීදියේ සන්ධියට සහ ලැස්කරින් වීදියේ සන්ධිය දක්වාත්ය; නැගෙනහිරට: ලැස්කරින් වීදියේ සිට බටහිර පැත්ත, ස්කිනර් පාරේ (දකුණ) සන්ධියේ සිට පෙදෙස හා ජම්පටා වීදිය; දකුණට: එහි සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස, කෝටබෝන් වීදිය සහ ලැස්කරින් වීදියේ සන්ධිය දක්වා පෙදෙස; සහ බටහිරට: එකී සන්ධියේ සිට කෝටබෝන් වීදියේ නැගෙනහිර පෙදෙස ජම්පටා වීදියේ සන්ධියේ සිට ස්කිනර් පාර (උතුර) සන්ධිය දක්වාවූ පෙදෙසත්ය | පෙ.ව. 10.45 | පෙ.ව. 7 | ප.ව. 7 | 5,000 |
| 5 | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර | එහි සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ උතුරු පෙදෙස පිකරිං පාරේ සහ කොටහේන වීදියේ සන්ධිය දක්වාවූ පෙදෙස | පෙ.ව. 11 | පෙ.ව. 7 | ප.ව. 7 | 5,000 |
| | | **කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ නාගරික පෙදෙසින් පිට)** | | | | |
| 6 | දකුණු අළුත්කුරු කෝරළේ | කඳාන ගමේ පමණක් | පෙ.ව.11.15 | පෙ.ව. 7 | ප.ව. 7 | 5,000 |
| 7 | දකුණු අළුත්කුරු කෝරළේ | තිඹිරිගස්යාය ගමේ පමණක් } කට්ටි නො. 1 | පෙ.ව. 11.30 | එම | එම | 5,000 |
| 8 | එම | උස්වැටකෙයියාව ගමේ පමණක් } | | | | |
| 9 | අළුත්කුරු කෝරළේ (ඒ) | මූකලන්ගමුව ගමේ පමණක් | පෙ.ව. 11.45 | එම | එම | 4,000 |
| 10 | අළුත්කුරු කෝරළේ (ඒ) | කටුනායක ගමේ පමණක් | දවල් 12.00 | එම | එම | 4,000 |
| 11 | අළුත්කුරු කෝරළේ (බී) | දගොන්න ගමේ පමණක් | ප.ව. 2.00 | එම | එම | 3,000 |
| 12 | අළුත්කුරු කෝරළේ (ඒ) | පිටිපන ගමේ පමණක් | ප.ව. 2.15 | එම | එම | 3,000 |
| 13 | අළුත්කුරු කෝරළේ (ඒ) | සිත්තප්පාඩුව ගමේ පමණක් | ප.ව. 2.30 | එම | එම | 2,500 |
| 14 | මීගමු නාගරික සභාව, කොට්ඨාශය නො. 11 | මීගමු නාගරික සභාව නො.11, කුරණගමේ පමණක් | ප.ව. 2.45 | පෙ.ව. 7.30 | ප.ව. 7.30 | 4,000 |
| 15 | මීගමු නාගරික සභාව, කොට්ඨාශ නො. 1 | මීගමු නාගරික සභාවේ කොට්ඨාශ නො. 10, ග්‍රෑන්ඩ් වීදියේ බෝලවලාන ගමේ පමණක් | ප.ව. 3.00 | එම | එම | 5,000 |
| 16 | කොච්චිකඩේ නගර සභාව | කොච්චිකඩේ නගර සභා සීමාව ඇතුළත කොච්චිකඩේ නගරයේ පමණක් | ප.ව. 3.15 | පෙ.ව. 7 | ප.ව. 7 | 4,000 |
| 17 | අළුත්කුරු කෝරළේ (බී) | බසියවත්ත ගමේ පමණක් | ප.ව. 3.30 | එම | එම | 1,500 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත්විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (ඊ) තැබෑරුම් විවෘත කරන වේලාව | (එෆ්) තැබෑරුම් වසන වේලාව. | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. |
|---|---|---|---|---|---|---|
| | | විකුණන දිනය : 1960 ජූලි මස 6 වැනි දින | | | | |
| 18 | අළුත්කුරු කෝරළේ (ඒ) | බම්බුකුලිය ගමේ පමණක් | පෙ.ව. 10.00 | පෙ.ව. 7 | ප.ව. 7 | 1,500 |
| 19 | අළුත්කුරු කෝරළේ (ඒ) | ඇත්ගාල ගමේ පමණක් | පෙ.ව. 10.15 | එම | එම | 2,500 |
| 20 | අළුත්කුරු කෝරළේ (ඒ) | කටාන නැගෙනහිර ගමේ පමණක් | පෙ.ව. 10.30 | එම | එම | 3,000 |
| 21 | අළුත්කුරු කෝරළේ (ඒ) | දළුපත ගමේ පමණක් | පෙ.ව. 10.45 | එම | එම | 3,000 |
| 22 | අළුත්කුරු කෝරළේ (ඒ) | පළඟතුරේ නැගෙනහිර ගමේ පමණක් | පෙ.ව. 11.00 | එම | එම | 3,000 |
| 23 | අළුත්කුරු කෝරළේ (ඒ) | පෝරුතොට ගමේ පමණක් | පෙ.ව. 11.15 | එම | එම | 2,500 |
| 24 | මීගමු නාගරික සභාව, කොට්ඨාශ නො. 3 | මීගමු නාගරික සභාවේ කොට්ඨාශ නො.3. කාමච්චෝඩ ගමේ පමණක් | පෙ.ව. 11.30 | පෙ.ව. 7.30 | ප.ව. 7.30 | 5,000 |
| 25 | මීගමු නාගරික සභාව, කොට්ඨාශ නො. 9 | මීගමු නාගරික සභාවේ කොට්ඨාශ නො. 9 උඩයාර්තෝප්පුහි උඩයාර්තෝප්පු ගමේ පමණක් | පෙ.ව. 11.45 | එම | එම | 3,000 |
| 26 | මීගමු නාගරික සභාව, කොට්ඨාශ නො. 5 | මීගමු නාගරික සභාවේ කොට්ඨාශ නො. 5 කුඩාපාඩුවෙහි කුඩාපඩුව ගමේ පමණක් | දවල් 12.00 | එම | එම | 3,000 |
| 27 | දකුණු අළුත්කුරු කෝරළේ | මහවත්ත ගමේ පමණක් } කට්ටි නො. II | | | | |
| 28 | දකුණු අළුත්කුරු කෝරළේ | බෝපිටිය ගමේ පමණක් } කට්ටි නො. II | ප.ව. 2.00 | පෙ.ව. 7.00 | ප.ව. 7.00 | 3,000 |
| 29 | දකුණු අළුත්කුරු කෝරළේ | දඹුගම ගමේ පමණක් } කට්ටි නො. II | | | | |
| 30 | ජාඇල පළාත් ආණ්ඩු සභාව, කොට්ඨාශ නො.1 | ජාඇළ පළාත් ආණ්ඩු සභාවේ නො. 1 කොට්ඨාශය, කණුවන ගමේ පමණක් } කට්ටි නො. III | | | | |
| 31 | ජාඇල පළාත් ආණ්ඩු සභාව, කොට්ඨාශ නො.2 | ජාඇල පළාත් ආණ්ඩු සභාවේ නො. 2 කොට්ඨාශය, වැලිගම්පිටිය ගමේ පමණක් } කට්ටි නො. III | ප.ව. 2.15 | එම | එම | 5,000 |
| 32 | දකුණු අළුත්කුරු කෝරළේ | ඒකල-මෙගොඩ බෝලන්ද ගමේ පමණක් } කට්ටි නො. III | | | | |
| 33 | අළුත්කුරු කෝරළේ (බී) | දෙමන්හන්දිය ගමේ පමණක් | ප.ව. 2.30 | එම | එම | 3,000 |

# විවිධ දැන්වීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කෑගල්ල දිස්ත්‍රික්කයේ නිවාස යෝජනා ක්‍රම

කෑගල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් ස්ථානවල සාදා ඇති කුලියට සින්නවීමේ ක්‍රමයට දිය හැකි අඩු කුලී ගෙවල් සඳහා ලංකාවේ පුරවැසියන් ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ:—

(1) මාවනැල්ලේ මීදේරිගමෙහි සාදා ඇති නිවාස 4ක්.

(2) ගලිගමුවේ කබගමුවෙහි සාදා ඇති නිවාස 6ක්.

පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත් භාර ගනු ලැබේ:—

(අ) තමන්ගේ සහ තමන්ගේ භාර්යාව/පුරුෂයාගේ සම්පූර්ණ මාසික ආදායම රුපියල් 200 ට නොවැඩි අය,

(ආ) මීදේරිගම නිවාස සඳහා පහත සඳහන් ගම්මුලාදෑනි කොට්ඨාශවල සථිරව පදිංචි හෝ රැකියාවෙහි නියුක්ත අය,

1. ගල්බොඩ සහ කිනිගොඩ කෝරළවලට අයත් ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයේ රන්කොත්දිවල වසම, කිරින්ගඩෙනිය වසම සහ හිඟුල වසම.

(ඇ) කබගමුවෙහි නිවාස සඳහා පහත සඳහන් ගම්මුලාදෑනි කොට්ඨාශවල සථිරව පදිංචි හෝ රැකියාවෙහි නියුක්ත අය,

1. ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් බෙලිගල් කෝරලේ කබගමුව වසම.

2. ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් පරණකුරු කෝරලේ රොටුව වසම.

2. සෑම ගෙයක්ම පිහිටා ඇත්තේ දළ වශයෙන් පර්චස් 15 ක් පමණ වූ ඉඩමකය. ගෙවල්වල වහල උළු සෙවිලි කර ඇති අතර බිම සිමෙන්තියෙන් සාදා ඇත. එක ගෙයකට ඉස්තෝප්පුවක්, කාමර දෙකක්, මුළුතැන් ගෙයක් සහ ජල මුද්‍රිත වැසිකිළියක් බැගින් තිබේ.

3. අවුරුදු 25 කින් මුළු මුදල ගෙවී යන පරිදි ගෙයක කුලිය මසකට රුපියල් 22 ක් පමණ වේ.

4. ගෙයි පදිංචිකාරයාට ගෙයි නීත්‍යානුකූල අයිතිය පැවරෙන්නේ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ විටය. ගෙයි පදිංචිකාරයා කෙසේ අවස්ථාවකදී ශෙෂව තිබෙන මුදල එකවිටම ගෙවා දැම්මත් සමගම ගෙයි නීත්‍යානුකූල අයිතියක් ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගියදා සිට ගෙයි පදිංචිකාරයා විසින්ම ගෙය නඩත්තු කළ යුතුවා පමණක් නොව, ගෙවල් කුලියද, වරිපණම් හා වෙනත් ගාස්තුද ගෙවිය යුතු වේ.

5. ගෙවල්වල පදිංචිය සඳහා සුදුසු අය තෝරා ගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස් වරයා විසිනි.

6. කොළඹ ජාතික නිවාස දෙපාර්තමේන්තුව මේ සඳහා පිළියෙල කර ඇති ඉල්ලුම් පත්‍ර මගින් ඉල්ලුම් කළ යුතු අතර එකී ඉල්ලුම් පත්‍ර 1960 ජූලි 22 වෙනි දිනට හෝ ඊට පෙර ජාතික නිවාස කොමසාරිස් තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත එවා දින 21ක් තුළදී එය ලැබුණු බවට දැන්වීමක් නොලැබුනොත් ඒ බැව් දන්වා තැපැල් කාර්යාලයයේ ලියා පදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහල කෙළවරේ "කෑගල්ල දිස්ත්‍රික්කයේ ගෙවල් සඳහා ඉල්ලුම් පත්" යැයි සඳහන් කළ යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.